# දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය

## දකුණු පළාත් සභා සිංහල මාධ්‍ය පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2018 / 2019

3.5 විභාග ගාස්තු ලෙස රු. 800/- ක මුදලක් දකුණු පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්, දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 2003.02.13 දරන අය ශීර්ෂයට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ පසු පිට නොගැලවෙන සේ අලවා එවිය යුතුවේ.

3.6 තැපැලේදී නැතිවන හෝ ප්‍රමාද වන අයදුම්පත් සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබෙන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු අයුරකින් සලකා බලනු නොලැබේ.

3.7 සැලකිය යුතුයි. අයදුම්පත්‍රය සමග විස්තර සහිත උපාධි සහතිකයේ ඡායා පිටපතක් අනිවාර්යයෙන්ම අමුණා එවිය යුතුය. එසේ නොවන්නේ නම් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

## 04. සේවා කොන්දේසි

4.1 මුලින් පත්වීම් ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අවම වශයෙන් වසර 10 ක් සේවය කළ යුතුවේ.

4.2 මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුවේ.

4.3 උසස් වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ සිදුකරනු ඇත.

4.4 උපාධියට අදාළ විෂයයන් යටතේ අයදුම්කළ යුතු අතර, පත්වීම් විෂයය කිසිදු හේතුවක් නිසා වෙනස් කරනු නොලැබේ.

## 05. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

5.1 අයදුම්පත පිරවීමේදී පහත උපලේඛන 01, 02, 03, 04, 05 පමණක් භාවිත කළ යුතුය.

### උපලේඛනය 01

| භාෂා මාධ්‍යය | කේත අංකය |
|---|---|
| සිංහල මාධ්‍යය | 2 |
| දෙමළ මාධ්‍යය | 3 |
| ඉංග්‍රීසි මාධ්‍යය | 4 |

### උපලේඛනය 02

| විෂයය | විෂය කේත අංකය |
|---|---|
| ගණිතය | 11 |
| විද්‍යාව | 12 |
| ඉංග්‍රීසි | 13 |
| නාට්‍ය හා රංග කලාව | 14 |
| චිත්‍ර | 15 |
| නැටුම් | 16 |
| සංගීතය | 17 |
| සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | 18 |
| තොරතුරු තාක්ෂණය | 19 |
| කෘෂි විද්‍යාව | 20 |
| භෞතික විද්‍යාව | 21 |
| රසායන විද්‍යාව | 22 |
| ප්‍රාථමික | 23 |
| සිංහල | 24 |
| ඉතිහාසය | 25 |
| පුරවැසි අධ්‍යාපනය | 26 |
| දේශපාලන විද්‍යාව | 27 |
| භූගෝල විද්‍යාව | 28 |

### උපලේඛනය 03

| පළාත | පළාත් අංකය |
|---|---|
| බස්නාහිර පළාත | 01 |
| මධ්‍යම පළාත | 02 |
| දකුණු පළාත | 03 |
| උතුරු පළාත | 04 |
| නැගෙනහිර පළාත | 05 |
| වයඹ පළාත | 06 |
| උතුරුමැද පළාත | 07 |
| ඌව පළාත | 08 |
| සබරගමුව පළාත | 09 |

THE ASSOCIATED NEWSPAPERS OF CEYLON LTD.ALL RIGHTS RESERVED

### උපලේඛනය 04

| නගරය | නගර අංකය |
|---|---|
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |

### උපලේඛනය 05

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | - | අංකය |
|---|---|---|
| අක්මීමන | - | 101 |
| අම්බලන්ගොඩ | - | 102 |
| බද්දේගම | - | 103 |
| බලපිටිය | - | 104 |
| බෙන්තොට | - | 105 |
| බෝපේ - පෝද්දල | - | 106 |
| ඇල්පිටිය | - | 107 |
| ගාල්ල | - | 108 |
| ගෝනපීනුවල | - | 109 |
| හබරාදූව | - | 110 |
| හික්කඩුව | - | 111 |
| ඉමදූව | - | 112 |
| කරන්දෙණිය | - | 113 |
| නාගොඩ | - | 114 |
| නෙළුව | - | 115 |
| නියාගම | - | 116 |
| තවලම | - | 117 |
| වැලිවිටිය - දිවිතුර | - | 118 |
| යක්කලමුල්ල | - | 119 |
| අකුරැස්ස | - | 120 |
| අතුරලිය | - | 121 |
| දෙවිනුවර | - | 122 |
| දික්වැල්ල | - | 123 |
| හක්මන | - | 124 |
| කඹුරුපිටිය | - | 125 |
| කිරින්ද පුහුල්වැල්ල | - | 126 |
| කොටපොල | - | 127 |
| මාලිම්බඩ | - | 128 |
| මාතර | - | 129 |
| මුලටියන | - | 130 |
| පස්ගොඩ | - | 131 |
| පිටබැද්දර | - | 132 |
| තිහගොඩ | - | 133 |
| වැලිගම | - | 134 |
| වැලිපිටිය | - | 135 |
| අම්බලන්තොට | - | 136 |
| අඟුණකොළපැලැස්ස | - | 137 |
| බෙලිඅත්ත | - | 138 |
| හම්බන්තොට | - | 139 |
| කටුවන | - | 140 |
| ලුණුගම්වෙහෙර | - | 141 |
| ඕකෙවෙල | - | 142 |
| සූරියවැව | - | 143 |
| තංගල්ල | - | 144 |
| තිස්සමහාරාමය | - | 145 |
| වලස්මුල්ල | - | 146 |
| වීරකැටිය | - | 147 |
| පිටපළාත් | - | 148 |

(සැ.යු. යම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීමට තරම් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති විටක ආසන්න නගරයක විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තවද උක්ත නගර සියල්ලෙහි හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම් කොළඹදී පමණක් විභාගය පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත)

06. මෙම නිවේදනයේ ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතියද, බඳවා ගැනීමේ ක්‍රමයට අදාළ කොන්දේසි සංශෝධන ද, කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම පිළිබඳව අවසන් තීරණය ගැනීම දකුණු පළාත් අධ්‍යාපන ලේකම් විසින් සිදු කරනු ලැබේ.

**වයි. වික්‍රමසිරි,**
**ලේකම්,**
**දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය.**

## දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය

# ආදර්ශ අයදුම්පත්‍රය

**කාර්යාල ප්‍රයෝජනය සඳහා** ☐

## දකුණු පළාත් සහා පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2018/2019

| | | | |
|---|---|---|---|
| ස්ථිර පදිංචි පළාත | | | |
| පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | | | |
| ඉල්ලුම් කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | | | |
| ඉල්ලුම් කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | | | |
| ඉල්ලුම් කරන විෂයයන් | 1. | 2. | 3. |
| ඉල්ලුම් කරන විෂයය අංකයන් | 1. | 2. | 3. |

01. විභාගයට ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍ය ☐
(අදාළ අංකය ගැසට් නිවේදනයේ උපලේඛන 01 අනුව කොටුව තුළ යොදන්න)

02. විභාගයට පෙනී සිටින නගරය

| නගරය | නගර අංකය |
|---|---|
| | |

(ගැසට් නිවේදනයේ උපලේඛන 04 අනුව යොදන්න)

03. අයදුම් කරනු ලබන පළාත

| පළාත | පළාත් අංකය |
|---|---|
| | |

(ගැසට් නිවේදනයේ උපලේඛන 03 අනුව යොදන්න)

04. 4.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(උදා: AMARAKOON MUDEYANSELAGE NAMAL HERATH)
..............................................................................
..............................................................................

4.2 අගට යොදන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොද නම
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (උදා: HERATH A.M.N.)
..............................................................................
..............................................................................

4.3 සම්පූර්ණ නම (සිංහල අකුරින්)
(උදා: අමරකෝන් මුදියන්සේලාගේ නාමල් හේරත්) ..............................

4.4 අගට යොදන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොද නම
(සිංහල අකුරින්) (උදා: හේරත් ඒ. එම්. එන්.) ..............................

05. 5.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
..............................................................................
..............................................................................

5.2 ස්ථිර ලිපිනය (සිංහල අකුරින්)
..............................................................................
..............................................................................
(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

06. 6.1 ජාතික හැඳුනුම්පත් අංකය :

6.2 උපන් දිනය වර්ෂය මාසය දිනය

6.3 2018.12.31 දිනට වයස අවුරුදු මාස දින

6.4 ස්ත්‍රී / පුරුෂ භාවය ☐ ස්ත්‍රී - 1 පුරුෂ - 2 (අදාළ අංක කොටුව තුළ යොදන්න)

6.5 දුරකථන අංක :

07. උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තරය

7.1 උපාධිය : ..............................
a. තිකුත් කළ විශ්වවිද්‍යාලය : ..............................
b. උපාධිය වලංගු දිනය : ..............................
c. ලබා ඇති පන්ති සාමාර්ථය : ..............................
d. උපාධිය හදාරා ඇති ප්‍රධාන විෂයය / විෂයයන් : ..............................
..............................................................................

08. 8.1 ගෙවා ඇති විභාග ගාස්තු රුපියල් (අකුරින්) ..............................
8.2 කුවිතාන්සියේ අංකය : ..............................
8.3 නිකුත් කළ කාර්යාලය : ..............................
8.4 දිනය : ..............................

09. ඔබ ආබාධිත තත්ත්වය යටතේ අයදුම්කරන්නේ නම්, ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න.
..............................................................................

10. ඔබ සාපරාධී වරදක් සම්බන්ධයෙන් අධිකරණයෙන් වරදකරුවකු කර ඇති අයෙක්ද ?
(ඔව් / නැත)

11. එසේම ඔබ කිසියම් වරදක් සම්බන්ධව රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූ පුද්ගලයෙක් ද?
(ඔව් / නැත)

12. උක්ත 10 ට හෝ 11 ට පිළිතුර ? "ඔව්" නම් විස්තර සපයන්න. ..............................

> කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න.
> මුදල් කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න.

13. අයදුම්කරුගේ / අයදුම්කාරියගේ ප්‍රකාශය

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. පුවත්පත් නිවේදනයේ සඳහන් සියලුම කොන්දේසි හා නියමයන් කියවා තේරුම්ගත් අතර, එම කොන්දේසි හා නියමයන්ට එකගව මෙම අයදුම්පත ඉදිරිපත් කරන බවද ප්‍රකාශ කරමි. එසේම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නම් කරන ඕනෑම පාසලක සේවය කිරීමට කැමැත්තෙමි. මා මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව ගුරුපත්වීමක් ලබා ගැනීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව මම දනිමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට යටත් බවද මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරන බවද ප්‍රකාශ කරමි.

.............................. ..............................
දිනය අයදුම්කරුගේ අත්සන

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................. මහතා / මහත්මිය / මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවද ඔහු / ඇය මා ඉදිරිපිටදී .............................. දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

.............................. ..............................
දිනය සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ..............................

තනතුර : ..............................

ලිපිනය : ..............................